28. ගම්පොළ යුගය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) හතරවන බුවනෙකබාහු රජතුමා ගම්පොළ සිය අගනගරය කර ගැනීම
(B) දෙවිනුවර උපුල්වන් දේවාලය ඉදිකරවීම
(C) යාපනයේ ආර්ය චක්‍රවර්ති පාලකයා ගම්පොළ රාජධානිය ආක්‍රමණය කිරීම (………)
(D) ගිරා හා හංස සන්දේශ රචනා කිරීම

29. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ පාලන සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) අඹන්වෙල රාළගේ කැරැල්ල
(B) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා නායක්කර් පෙළපතේ ප්‍රථම පාලකයා විය.
(C) භික්ෂු උපසම්පදාව යළි පිහිටුවීම (………)
(D) 1766 දී ලන්දේසීන් සමඟ ගිවිසුමක් අත්සන් කිරීම

30. දහනව වන සියවසේ වතු වගාවේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ආරම්භයේ දී විදේශීය ප්‍රාග්ධනය හා විදේශීය ශ්‍රමය උපයෝගී කර ගනිමින් වතු වගාව ඇරඹිණි.
(B) දහනව වන සියවස අවසන් වන විට තේ, ප්‍රධාන වතු වගාව බවට පත්වීම
(C) මධ්‍යම කඳුකර ප්‍රදේශයේ වතු නිෂ්පාදන ප්‍රධාන වශයෙන් ත්‍රිකුණාමලය වරායෙන් අපනයනය කරන ලදී. (………)
(D) කෝපි වගාව පරිහානියට පත්වීමෙන් පසු උඩරට ප්‍රදේශවල කුරුඳු වගාව ව්‍යාප්ත විය.

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති **වරහන තුළ ලියන්න.**

31. පණ්ඩුකාභය රජතුමාගේ අනුප්‍රාප්තිකයා කවු ද?
(1) සුමිත්ත
(2) උපතිස්ස
(3) මුටසිව
(4) අභය (………)
(5) පණ්ඩුවාසුදේව

32. ඇලහැර ඇළ ඉදිකරවන ලද්දේ කවරකු විසින් ද?
(1) වසභ
(2) ධාතුසේන
(3) පළමුවන මොග්ගල්ලාන
(4) පළමුවන අග්ගබෝධි (………)
(5) පළමුවන සේන

33. නිශ්ශංකමල්ල රජතුමා විසින් ආක්‍රමණය කරන ලදැයි සැලකෙන දකුණු ඉන්දියානු ප්‍රදේශය කුමක් ද?
(1) මහබලිපුරම්
(2) මදුරාපුරය
(3) සෝමේශ්වරම්
(4) රාමේශ්වරම් (………)
(5) අභිවීරරාමපට්ටනම්

34. ගඩලාදෙණිය විහාරය ඉදිකළ ගෘහ නිර්මාණ ශිල්පියා කවු ද?
(1) ස්ථපතිරායර
(2) ගණේශ්වරාචාර්ය
(3) දෙවරගම්පල සිල්වත් තැන
(4) දේවේන්ද්‍ර මූලාචාරි (………)
(5) නිලගම ආබරණප්පු

35. විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවන ලද්දේ කවරකු විසින් ද?
(1) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
(2) මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි
(3) වලානේ සිද්ධාර්ථ හිමි
(4) රත්මලානේ ධර්මාලෝක හිමි (………)
(5) වැලිවිටියේ සෝරත හිමි

9\. (1) ධර්මපාල - දෙම් ජුවාන්
(2) කරල්ලියද්දේ බණ්ඩාර - දෙම් ජුවාන් ද කැස්ත්‍රෝ
(3) යමසිංහ බණ්ඩාර - දෙම් පිලිප්
(4) කුසුමාසනදේවී - දෝන කැතරිනා
(5) කොනප්පු බණ්ඩාර - ඔස්ට්‍රියාවේ දෙම් ජුවාන්

(.........)

10\. (1) රාජකාරි ක්‍රමය අහෝසි කිරීම - තෝමස් මේට්ලන්ඩ්
(2) උඩරට රාජ්‍යය බිඳවැටීම - රොබට් බ්‍රවුන්රිග්
(3) කොළඹ-මහනුවර මාර්ගය ඉදිකිරීම - එඩ්වඩ් බාන්ස්
(4) මහ නගර සභා පිහිටුවීම - හර්කියුලීස් රොබින්සන්
(5) ධාන්‍ය බද්ද අහෝසි කිරීම - ආතර් හැව්ලොක්

(.........)

- අංක **11** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නො වේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ ලියන්න.**

11\.

X
(i) වේවැල්කැටිය සෙල්ලිපිය
(ii) කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය
(iii) හොපිටිගමු වැම් ලිපිය
(iv) ගොඩවාය සෙල්ලිපිය
(v) සංගමු විහාර සෙල්ලිපිය

Y
A වෙළඳ ගමක කළමනාකරණය පිළිබඳ නීතිරීති
B පාලකයන් දෙදෙනකු විසින් ඇති කරගත් සාම ගිවිසුමක්
C ගම්වල අධිකරණ පරිපාලනය පිළිබඳ නීතිරීති
D ගමක පාලනය පිළිබඳ නීතිරීති
E නැව් තොටකින් ලැබුණු තීරුබදු

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC (.........)

12\.

X
(i) දුට්ඨගාමණී
(ii) වට්ටගාමණී අභය
(iii) ධාතුසේන
(iv) පළමුවන විජයබාහු
(v) පළමුවන පරාක්‍රමබාහු

Y
A රවිදේව
B කපිසීස
C නන්දිමිත්‍ර
D මිගාර
E ලංකාපුර

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC (...3...)

13\.

X
(i) 1562
(ii) 1594
(iii) 1602
(iv) 1630
(v) 1638

Y
A බලන සටන
B ගන්නොරුව සටන
C මුල්ලේරියා සටන
D දන්තුරේ සටන
E රන්දෙනිවෙල සටන

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC (.........)

14\.

X
(i) රොබට් නොක්ස්
(ii) ජේම්ස් කෝඩිනර්
(iii) ජෝන් ඩොයිලි
(iv) තෝමස් ස්කිනර්
(v) එමසන් ටෙනන්ට්

Y
A සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ලුහුඬු සටහන් (*A Sketch of the Constitution of the Kandyan Kingdom*)
B ලංකාව: දිවයින පිළිබඳ විස්තරයක් (*Ceylon: An Account of the Island*)
C ලංකාවේ පනස් වසරක් (*Fifty Years in Ceylon*)
D එදා හෙළදිව (*An Histotrical Relation of the Island of Ceylon*)
E ලංකාව පිළිබඳ විස්තරයක් (*A Description of Ceylon*)

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC (...2...)

[ තුන්වෙනි පිටුව බලන්න.

